# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1954/10 - 2016 පෙබරවාරි මස 16 වැනි අඟහරුවාදා - 2016.02.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීමේ නියෝගය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතින් හා බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 02(2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම් සහ කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍ය කැප්ටන් ලලිත් වනිගරත්න වන මම බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහය වීම පිණිස පත් කර ඇත්තා වූ පහත සඳහන් අංක I වැනි උප ලේඛනයේ I වැනි තීරුවේ නම් සඳහන් තැනැත්තා වෙත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 02(2) වගන්තිය යටතේ හා එකී ප්‍රඥප්තිය 72(2) වගන්තියේ විධිවිධාන අනුව වලංගු සමුපකාර සමිති රීති මාලාව යටතේ බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇති පහත දැක්වෙන එකී උප ලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

කැප්ටන් ලලිත් වනිගරත්න,
ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා
වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්
සහ කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍ය
බස්නාහිර පළාත.

2016 ජනවාරි මස 29 වැනි දින.

**I වැනි උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| සීමන් මේරු පතිරණගේ සශිකා නිරෝශනී | 2015.12.02 | බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක 02(3),4, (4(2) හැර), 5, 6, 7, 8, 33, 43(අ), 43(ආ), 44, (44 (6) හැර), 45, 46, 47, 50, 52, 53, 54 (54 (2) හැර), 58(2), 59, 67, 68, 69, 74 හා 76 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල සහ සමුපකාර රීති මාලාවේ 4, 11, 15, 16 (II), 19, 27, 32, 37, 39, 40, 41, 42, 49, 52 හා 53 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල |

03 - 38

1A - PG 2845 — 08 (2016/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*